# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1724/19 – 2011 සැප්තැම්බර් 23 වැනි සිකුරාදා – 2011.09.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2010 අංක 89 දරන ආඥාව අවලංගු කිරීම**

මගේ යොමු අංකය: 13/98/ඊ/134.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ප්‍රාලේ/ඉඅ4/1/45.

1972 අංක 18 සහ 1974 අංක 29 දරන අර්ථ නිරූපන (සංශෝධිත) පනත්වලින් සංශෝධිත අර්ථ නිරූපන ආඥා පනතේ (12 වන අධිකාරය) 18 වැනි වගන්තියට අනුකූලව ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම අංක 1658/26 හා 2010 ජූනි 16 වැනි දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ 2010 අංක 89 දරන ආඥාව මෙයින් අවලංගු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2011 අගෝස්තු මස 08 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'ගොවිජන මන්දිරය',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 - 178

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) ආඥාව

**2011 අංක 187 දරන ආඥාව**

මගේ යොමු අංකය: 13/98/ඊ/134.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ප්‍රාලේ/ඉඅ/4/1/45.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2011 අගෝස්තු මස 08 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'ගොවිජන මන්දිරය',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, හබරාදූව.

2. **ඉඩමේ විස්තරය.**– දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හීනටිගල ගමේ පිහිටි ගාල්ල දිස්ත්‍රික් මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද මු.පි. 3128 හා 2002.05.31 දිනැති මූලික පිඹුරෙහි කැබලි අංක 1 වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0279ක් පමණ වන 'දේවාලවත්ත *නොහොත්* වෙල්ලාලගෙවත්ත' නමැති ඉඩම් කොටසට මායිම්:

උතුරට: ගා/හීනටිගල ශාරිපුත්‍ර මහා විද්‍යාලය හිමිකම් කියන බෝදරවත්ත සහ ඉඳිගහලවත්ත; නැගෙනහිරට: ගා/හීනටිගල ශාරිපුත්‍ර මහා විද්‍යාලය හිමිකම් කියන බෝදරවත්ත සහ ඉඳිගහලවත්ත; දකුණට: මාර්ගය සහ මහා මාර්ගය; බටහිරට: මහා මාර්ගය සහ ගා/හීනටිගල ශාරිපුත්‍ර මහා විද්‍යාලය හිමිකම් කියන බෝදරවත්ත සහ ඉඳිගහලවත්ත.

10 - 179

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2011 අංක 08 දරන ආඥාව**

මගේ අංකය: එල්ඩී/05/2006/ඩබ්එස්/145.
ඔබේ අංකය: එන්ජ්/සී/එන්ඩබ්එස්ඩීබී/2008/02.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානයට යටත්ව අංක 1713/18 හා 2011.07.07 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 1ඒ පිටුවේ පළ කරන ලද 2011 අංක 129 දරන ආඥාවේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා 'ප්‍රාදේශීය ලේකම් මන්නාරම' යන්න 'ප්‍රාදේශීය ලේකම් නානත්තන්' ලෙස නිවැරැදි විය යුතු බවත්, ඉඩම් විස්තරයේ සඳහන් 'නාන්තාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ' යන්න 'නානත්තන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ' ලෙස නිවැරැදි විය යුතු බවත් මෙයින් ප්‍රකාශ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2011 සැප්තැම්බර් මස 13 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'ගොවිජන මන්දිරය',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 - 180

---

# ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ආඥාව අවලංගු කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1542/1 හා 2008 මාර්තු මස 24 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2008 අංක 82 හා 2008 මාර්තු 12 වැනි දින දරන ආඥාවෙන් මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තර ලෙස දක්වා ඇති ඉඩම *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය* වෙත පැවරී තිබේ. එනමුත් මේ කියන ලද ඉඩමේ භුක්තිය *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය* වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 1542/1 හා 2008.03.24 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2008 අංක 82 හා 2008.03.12 දින දරන ආඥාව මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2006/වීර්ටී/230.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 4/5/1-2/739/6
2011 සැප්තැම්බර් මස 13 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 80/5, ''ගොවිජන මන්දිරය'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහගම්මැද්ද ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මු.පි.ක. 4109 හා 2008.08.15 දිනැති මූලික පිඹුරේ ප්‍රමාණයෙන් හෙක්. 0.0092ක් පමණ වන කැබලි අංක 1 ඉඩම් කොටසට මායිම්:

උතුරට: පී. ඩී. රංජිත් සහ කේ. වී. කුමාරතුංග හිමිකම් කියන වැල්ලගෙවත්ත; නැගෙනහිරට: කේ. වී. කුමාරතුංග හිමිකම් කියන වැල්ලගෙවත්ත සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ පී. ඒ. ඇන්ටනි ප්‍රනාන්දු හිමිකම් කියන වැල්ලගෙවත්ත සහ මු.පි.ක. 4019හි කැබලි අංක 1; බටහිරට: මු.පි.ක. 4019හි කැබලි අංක 1 සහ පී. ඩී. රංජිත් හිමිකම් කියන වැල්ලගෙවත්ත.

10 – 181

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.